# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
# පුරප්පාඩු

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (I ශ්‍රේණිය), සහකාර/නියෝජ්‍ය ලේකම් (II ශ්‍රේණිය), ගණකාධිකාරී (II ශ්‍රේණිය), ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (II ශ්‍රේණිය), පරිපාලන නිලධාරී (II ශ්‍රේණිය), වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති /සැලසුම්) (III ශ්‍රේණිය), වැඩසටහන් නිලධාරී (මුදල්) (III ශ්‍රේණිය), සංවර්ධන නිලධාරී (III ශ්‍රේණිය), කළමණාකරන සේවා නිලධාරී (III ශ්‍රේණිය), රියදුරු (III ශ්‍රේණිය) තනතුරු සඳහා බඳවා ගැනීමට, සුදුසුකම් ඇති ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පොදු සුදුසුකම්**

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට,

**ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (I ශ්‍රේණිය)** - වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි;

**සහකාර/නියෝජ්‍ය ලේකම් (II ශ්‍රේණිය)** - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**ගණකාධිකාරී (II ශ්‍රේණිය)** - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (II ශ්‍රේණිය)** - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**පරිපාලන නිලධාරී (II ශ්‍රේණිය)** - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති /සැලසුම්/ මුදල් ) (III ශ්‍රේණිය)** - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**කළමණාකරන සේවා නිලධාරී (තාක්ෂණික නොවන) (III ශ්‍රේණිය)** - වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

**රියදුරු (III ශ්‍රේණිය)** - වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;

(රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

(iv) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයක් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**03.** එක් එක් තනතුරට අදාල තොරතුරු

| | |
|---|---|
| 3.1 තනතුරු නාමය | **ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී -(I ශ්‍රේණිය)** |
| 3.1.1 වැටුප් පරිමාණය | **AR 2- 2025: (133,220 - 3,600 x 10 - 169,220)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.** |
| 3.1.2 සුදුසුකම් | **බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**<br>1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් විශේෂවේදී උපාධියක්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Postgraduate Degree) ලබා තිබීම<br>**සහ**<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.<br><br>2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (PhD)<br>**සහ**<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්** (පහත සඳහන් 1 හෝ 2 හෝ 3)<br>1 ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් විශේෂවේදී /සාමාන්‍ය උපාධියක්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Postgraduate Degree) ලබා තිබීම.<br><br>**සහ**<br>"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයේ (AR1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් විශේෂවේදී /සාමාන්‍ය උපාධියක්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (Ph.D) ලබා තිබීම<br>**සහ**<br>"අධ්‍යයන/පර්යේෂණ" සේවා (AR1) ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම |

| | |
|---|---|
| 3.2 තනතුරු නාමය | **i. සහකාර/නියෝජ්‍ය ලේකම් - (II ශ්‍රේණිය)**<br>**ii. ගණකාධිකාරී - (II ශ්‍රේණිය)** |
| 3.2.1 වැටුප් පරිමාණය | **MM 1-1 - 2025 : රු. (91,690 – 10 X 2, 480 - 15 X 3,450 –168,240)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.** |
| 3.2.2 සුදුසුකම් | **i. සහකාර / නියෝජ්‍ය ලේකම් - II**<br><br>**බාහිර අයදුම්කරුවන්**<br><br>1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, වාණිජ්‍ය, ව්‍යාපාර පරිපාලන හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br>**සහ**<br>2. උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>2. "කණිෂ්ඨ කළමනාකාර" JM සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>**(ii) ගණකාධිකාරී -(II ශ්‍රේණිය)**<br><br>**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 )**<br><br>1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලන, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ්‍ය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br>**සහ**<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්**<br><br>ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. |
| 3.3 තනතුරු නාමය | **ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී -(II ශ්‍රේණිය)** |
| 3.3.1වැටුප් පරිමාණය | **AR** 1- 2025 : රු. (91,650 **- 10 x** 2,480 **- 15 x** 3**,**450 **–** 168,200) |

| | |
|---|---|
| 3.3.2 සුදුසුකම් | **රාජ්‍ය කළමනාකරණ සේවා 1/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.**<br><br>**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, සංඛ්‍යානය, කළමනාකරණය, විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් විශේෂවේදී උපාධියක් ලබා තිබීම.<br><br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, සංඛ්‍යානය, කළමනාකරණය, විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් සාමාන්‍ය උපාධියක් සමඟ අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>2. "වැඩසටහන් නිලධාරී/සංවර්ධන නිලධාරී" (MA - 4) සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 3.4 තනතුරු නාමය<br><br>3.4.1 වැටුප් පරිමාණය<br><br><br>3.4.2 සුදුසුකම් | **පරිපාලන නිලධාරී - (II ශ්‍රේණිය)**<br><br>**JM 1 -1 - 2025 : රු. (72,650-10 x 1,360-18 x 2,040 - 122,970)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 1/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.**<br><br>**බාහිර අයදුම්කරුවන්**<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>**2.** "කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" (MA 1) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 3.5 තනතුරු නාමය<br><br><br><br>3.5.1 වැටුප් පරිමාණය | **(i) වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/ සැලසුම්) - (III ශ්‍රේණිය)**<br>**(ii) වැඩසටහන් නිලධාරී (මුදල්) - (III ශ්‍රේණිය)**<br>**(iii) සංවර්ධන නිලධාරී - (III ශ්‍රේණිය)**<br><br>**MA 4 – 2025 - රු. (64,320-10 x 1,360 - 15 x 1,670-5 x 2,040-113,170)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.** |

| | |
|---|---|
| 3.5.2 සුදුසුකම් | **(i) වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/ සැලසුම්) - (III ශ්‍රේණිය)**<br><br>**බාහිර අයදුම්කරුවන්**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>2."කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" (MA 1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>**(ii) වැඩසටහන් නිලධාරී (මුදල්) - (III ශ්‍රේණිය)**<br><br>**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය, වාණිජ, ව්‍යාපාර පරිපාලනය, හා කළමනාකරණය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br><br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයකින් අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>2. "කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" (MA 1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>**(iii) සංවර්ධන නිලධාරී තනතුර (III ශ්‍රේණිය)**<br><br>**බාහිර අයදුම්කරුවන්**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන, කළමනාකරණ, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br><br>**2.** " කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන "(MA 1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

| | |
|---|---|
| 3.6 තනතුරු නාමය | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - (III ශ්‍රේණිය )** |
| 3.6.1 වැටුප් පරිමාණය | **MA 1 - 1 – 2025 -රු. (46,220–10 x 540–7x630–4 x 890–20x1,190 – 83,390)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.** |
| 3.6.2 සුදුසුකම් | **බාහිර අයදුම්කරුවන්**<br>**අධ්‍යාපන**<br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී<br>i. සිංහල / දෙමළ<br>ii. ගණිතය<br>iii. ඉංග්‍රීසි භාෂාව<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :-<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා හය මසකට නොඅඩු පරිගණක පාඨමාලාවකින් සමත්ව තිබීම.<br>**අභ්‍යන්තර අයදුම්කරුවන්**<br>(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී<br>i. සිංහල / දෙමළ<br>ii. ගණිතය<br>iii. ඉංග්‍රීසි භාෂාව<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම හා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා හය මසකට නොඅඩු පරිගණක පාඨමාලාවකින් සමත්ව තිබීම.<br>(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.<br>(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය. |
| 3.7 තනතුරු නාමය | **රියදුරු - (III ශ්‍රේණිය)** |
| 3.7.1 වැටුප් පරිමාණය | **PL 3 - 2025- රු. (43,280–10 x 490–10x540 –10x590–12x630 – 67,040)**<br>**රාජ්‍ය කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.** |
| 3.7.2 සුදුසුකම් | **බාහිර අයදුම්කරුවන් :-**<br>**අධ්‍යාපන සුදුසුකම් :**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර |

| | |
|---|---|
| | ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.<br><br>**ප්‍රවීණතා**<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍ර ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනිමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>**සහ**<br>ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම. |

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2025.10.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, පළමු මහල, Block 5, BMICH, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් අදාළ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව සලකා බැලේ.(ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරඟ විභාගයක හා/හෝ පත්වීම් බලධරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනු ලැබේ.)

*සැලකිය යුතුයි. - ආයතනය දැනට පළමු මහල, Block 5, BMICH, කොළඹ 07 යන ස්ථානයේ ස්ථාපනය කර ඇති අතර ශාඛා කාර්යාල නොමැත.

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහල,Block 5, BMICH,
කොළඹ 07.

## ආදර්ශ අයදුම් පත්‍රය

(ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (I ශ්‍රේණිය), සහකාර/නියෝජ්‍ය ලේකම් (II ශ්‍රේණිය), ගණකාධිකාරී (II ශ්‍රේණිය), ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී (II ශ්‍රේණිය), පරිපාලන නිලධාරී (II ශ්‍රේණිය), වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති /සැලසුම්) (III ශ්‍රේණිය), වැඩසටහන් නිලධාරී (මුදල්) (III ශ්‍රේණිය), සංවර්ධන නිලධාරී (III ශ්‍රේණිය) තනතුරු සඳහා පමණි)

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ………………………………………………………………………**

**තනතුර සඳහා අයදුම් පත්‍රය**

1 අයදුම්කරුගේ සම්පූර්ණ නම:……………………………………

  1.1 මුලකුරු සමග නම:……………………………………

2. ස්ථිර ලිපිනය:……………………………………
3. දුරකතන අංකය : ……………………………………
4. ජාතික හැඳුනුම්පත් අංකය:……………………………
5. උපන් දිනය: වර්ෂය …………….. මාසය ……………. දිනය ………………

  5.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස: වර්ෂ………….. මාස ………… දින …………..

6. ස්ත්‍රී/පුරුෂ භාවය:……………………………
7. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :…………………………
8. අධ්‍යාපන සුදුසුකම්

  8.1 ප්‍රථම උපාධියේ විස්තර

  උපාධියේ නම

  උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය

  උපාධිය බාහිර/අභ්‍යන්තර ද යන වග

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | උපාධි විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

  8.2 පශ්චාත් උපාධි හෝ වෙනත් උපාධි පාඨමාලා පිළිබඳ විස්තර

  උපාධියේ නම

  උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | උපාධි විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

9. වෙනත් සුදුසුකම්:

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

10. වෘත්තීය සුදුසුකම්:

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

11. සේවා පළපුරුද්ද (අධ්‍යාපන හා පර්යේෂණ)

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

12. මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

..................................... ...............................................

දිනය අයදුම්කරුගේ අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................................................ මහතා/මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ...................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි. ......................... අත්සන සහතික කරන අයගේ අත්සන.

.........................

අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ..................................

ස්ථානය : ....................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.

.................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .......................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

............................................ ............................................................

දිනය අත්සන හා නිල මුද්‍රාව

## ආදර්ශ අයදුම් පත්‍රය

(කළමණාකරන සේවා නිලධාරී (III ශ්‍රේණිය), රියදුරු (III ශ්‍රේණිය) තනතුරු සඳහා පමණි)

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ……………………………………………………………………**
**තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:……………………………………
   1.1 මුලකුරු සමග නම:……………………………………
2. ස්ථිර ලිපිනය:……………………………………
   දුරකතන අංකය : ……………………………………
3. ජාතික හැඳුනුම්පත් අංකය:……………………………
4. 4.1 උපන් දිනය: වර්ෂය ……………… මාසය ……………… දිනය ………………
   4.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස: වර්ෂ…………… මාස ………… දින ……………
5. ස්ත්‍රී/පුරුෂ භාවය:…………………………
6. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :…………………………
7. අධ්‍යාපන සුදුසුකම්

   7.1 අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය :

   වර්ෂය : ……………………………………
   විභාග අංකය : ……………………………………
   මාධ්‍යය : ………………

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

   7.2 අ. පො. ස. උසස් පෙළ විභාගය :

   වර්ෂය : ……………………………………
   විභාග අංකය : ……………………………………
   මාධ්‍යය : ………………

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

8. වෙනත් සුදුසුකම්:

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

9. වෘත්තීය සුදුසුකම්:

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

10. සේවා පළපුරුද්ද :

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

11. මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

......................................                    ...............................................

දිනය                    අයදුම්කරුගේ අත්සන

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................................................... මහතා/මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ...................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

...............................................

අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ..................................

ස්ථානය : ....................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13. දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .......................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

............................................ ............................................................

දිනය අත්සන හා නිල මුද්‍රාව